# රටක් පිනවන හඬක්
# ඇන්ජලීන්



ජානක ඉලුක්කුඹුර




- සිටු මැදුරේ හෝ පුංචි පැලේ හෝ..
- ඈත හවේ හෝ මා ඔබ හමුවී තිබුණා...
- මට ආසයි හිනැහෙන්න මුළු ජීවිතේ...
- ඔකඳ වෙලා සිත ඔකඳ වෙලා...
- ආලේ මිහිර පෙන්නා සියොතුන් නාද
- දෙන්නා.....
- හෝ.... මාගේ සිතින් දරන්නට බැරි...
- සිතුම් පැතුම් සිරි පිරී..
- කලක් ඇවෑමෙන් පෙරුම් පුරා....
- දෝතින් දෝතයි ජීවෙන් ජීවේ..
- ඉර සඳ වැඳලා.....
- මියුරු පෙම් මදිරාවේ......
- රන් කෙන්දෙන් රනින් සැදූ රන්
- ඔන්චිල්ලා....
- පෙම්වතියන්ගේ පෙම්වතියන්ගේ....
- පුංචි පුතා මගේ ඉස්කෝලේ ගිය.....

මේ ගී පද දුටු සැණින් මා පවසන්නට යන්නේ කවුරුන් ගැනද යන්න ඔබට රහසක් නොවනු ඇත. මෙහි මා සඳහන් කර ඇත්තේ ගණනින් අතිමහත් ප්‍රමාණයක් වූ ඇය ගැයූ මියුරුතම ගීත අතරින් දොළහක් පමණි. ඒ මේ සුවිශේෂී චරිතය විසිතුරු ලෙස මැවීම වෙනුවෙනි. අනතුරුව ඇය විසින් ගයනු ලැබූ ගීත ගඟුල මටත් වඩා හොඳින් ඔබේ මතකයට පිවිසෙනු ඇත.

කවුරුන්ද මේ සුවිශේෂී වූ චරිතය...? එතුමිය අන් කවරෙකුවත් නොව ශ්‍රී ලාංකීය ගීත ක්ෂේත්‍රයට සිය සහජ ගායන හැකියාවෙන් උපරිම මෙහෙවරක් ඉටුකල, කලා ලොවේ කව්රුත් ඇන්ජී ලෙසින් ආදරයෙන් ඇමතූ ඇන්ජලීන් ගුණතිලකය. (විවාහයට පෙර ඇන්ජලීන් ද ලැනරෝල්)

*************************

## අතුරු කතාවක්

මගේ සිත 60 දශකයේ අග වෙත දිවයයි. මතකයේ හැටියට ඒ 67 වසරයි. ස්ථානය කඳාන. ජ. ඒ. චිත්‍රාගාරය. දෛවෝපගතව හිමිවූ අනගි අවස්ථාවක් හේතුවෙන් පැංචා චිත්‍රපටය සඳහා ගීතයක් ගායනය කිරීමට මා හට මගපෑදුනි. ඒ ආච්චියේ පෝච්චියේ වතුර නටනවෝ නම් ළමා ගීතයයි. ඒ ගීතයට අමතරව එහි එන සමූහ ගායනයකටද මාව තෝරාගැනිණි. පාසලක දරුවන් සඳහා ගුරුවරියක් ඔවදන් දෙන අදහසක් මේ ගීතයට ඇතුලත් වුනි. මේ ගීතය ගායනය වෙනුවෙන් එක්තරා සැදෑවක සිහින් උස, ඉතා පැහැපත් සුන්දර ගැහැනු රුවක් පැමිණ සිටිනු දක්නට ලැබුණි. ඒ වකවානුව වනවිටත් ඇය චිත්‍රපට සහ ගුවන්විදුලි සරළ ගී ගායනයෙන් ඉතා ජනප්‍රිය තත්වයක සිටිබව කිවයුතුය. එහි සිටි මගේ මව විසින් ඇයව දුටු සැනින් හඳුනාගනු ලැබීය. ඇත්තෙන්ම මයික්‍රපෝ නය ඉදිරියේ එදින ඇය කල ගායනය අසා මා මවිතයට පත්වුනි. රුවත් ගායනයත් එකලෙසින් කෙනෙකුට පිහිටීම කෙතරම් භාගයයක්ද.? ඒ සියල්ල ඇය සතුව පැවතුනි. අත්දැකීම් නොලැබූ මා ඇතුළු කිහිපදෙනා සමගින් ඇය ඉතාමත් කුළුපග විය. ලැබුණු විරාමයකදී අත දිගු කරන්න යැයි පවසා මා අතේ සූකිරි කැට කිහිපයක් තැබූ සැටි තවමත් හොඳින් මතකය. එවකට කුඩා දරුවෙක් වූ මා හට එය ඉතා වටිනා සිහිවටනයක් වුණා. පැණි රහා ලෝකයේ කූඹියෝ එකමුතුයි.. එම ගීතයයි. මේ ඇය පිලිබඳව මට ඇති මිහිරිතම මතකයයි.

********************

දැන් නැවතත් මා මේ අපූරුතම ගායිකාව දෙසට යොමුවෙන්නම්. මා ඇය ගැයූ මුල්ම සරළ ගීතය හෝ චිත්‍රපට ගීතය ගැන සෙවීමට මේ මොහොතේ උත්සාහ නොකරමි. මා හට ඇයගේ හඬ වඩාත් තදින් දැනුන, එමෙන්ම හොඳින්ම සටහන් වුණු චිත්‍රපට ත්‍රිත්වයක් මතක් කරන්නට කැමැත්තෙමි.

දීපශිකා, සැනසුම කොතැනද සහ සුදු දුව මේ චිත්‍රපට ත්‍රිත්වයයි.

දීපශිකාඩ චිත්‍රපටයේ ඇය ජෝතිපාලයන් හා එක්ව ගැයූ ප්‍රේමේ දීපශිකා සහ මේ මෝසම් මද සුළඟ පවා යන ගීත ඒ කාලයේ ඉමහත් ජනප්‍රියත්වයට පත්වුනි.

සැනසුම කොතැනද චිත්‍රපටයේ හරූන් ලන්ත්‍රා සමගින් ගයන සුලං කුරුල්ලෝ ගීතයද ඉතාමත් මිහිරි සුවිශේෂී ගීතයකි.

සුදු දුවඩ චිත්‍රපටය සඳහා ගැයූ ආවා සොයා ආදරේ සහ මෙ රාත්‍රියේ මධු සඳෙන් යන යුග ගායනයන් ඒ යුගයේ කාගෙත් මුවග රැඳුණු ඉතාමත් ජනප්‍රිය ගීත බවට පත්වුනි. ගුවන්විදුලියට ජෝති හා ගැයූ ආලේ මිහිර පෙන්නා සහ වාසනාව පෑදේවී යන ගීත මිහිරිතම ස්වතන්ත්‍ර ගීත දෙකක් ලෙස හඳුන්වන්නට කැමැත්තෙමි.

එම්. එස්. ප්‍රනාන්දු සමග ගැයූ නෙලුම් මලේ පෙති කඩලා ගීතයද ඉතා මියුරු බයිලා ගනයේ ගීතයකි. තව එවැනිම ජනප්‍රිය ගීත ගණනාවක් විවිධ ගායකයන් සමග සහ තනිවමද ඇය ගායනය කොට ඇත. සැබැවින්ම ඒවා පිලිබඳව මෙවැනි කෙටි සටහනකින් ගෙනහැරපෑම අසීරු කටයුත්තකි. එබැවින් ඔබටම ඒවා යලිත් මතක්කර රස විඳීමට ඉඩහරිමි.

සොහොයුරෝ ඇය මුලින්ම ගීතයක් ගායනය කල චිත්‍රපටයයි. එහි සිඩ්නි ආටිගල සමගින් ඇය යුග ගීතයක් ගයා ඇත. අනතුරුව දෙයියන්ගේ රටේ සහ දස්කම වෙනුවෙන් ගීත ගැයුවාය. (මේ

38 වන පිටට

**ඔබේ නිවාඩුව මීගමුව, වයික්කාල සංචාරක පුරවරයේ ගත කිරීමට ඔබත් කැමති ද ?**



- විනාඩි 5 වැනි කෙටි කාලයකින් මුහුදු වෙරළට,
- කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට විනාඩි 20,
- තලවිල ශා.ආනා දේවස්ථානයට පැය 2,
- මීගමුව නගරයට විනාඩි 10,

කොළඹ පුත්තලම් ප්‍රධාන මාර්ගයේ සියලු පහසුකම් සහිත **දෙමහල් නිවස** ,

- ඉඩ පහසුකම් සහිත ඉතා අලංකාරවත් ගෙවත්තක පිහිටි,
- සියලු පහසුකම් සහිත සුවපහසු නිදන කාමර 4 කින් ද,
- අංගසම්පූර්ණ නාන කාමර 4 කින් ද,
- Entertainment Area,
- කාර්යාල කාමරයකින්ද,
- Completed Modern Pantry & Kitchen,
- සේවක නිදන කාමරයකින් ද,
- 3 Balconies & Sitting dining area ,
- සියළුම ගෘහභාණ්ඩ
- මාසික AU $ 650 මුදලකට

අවශ්‍යතාව අනුව නිවසේ උඩුමහල සහ පහළ මාලය වෙන වෙනම ලබා ගත හැකිය.

අමතන්න :
0411598744
(03) 97929977